බලශක්ති කාර්යක්ෂම උපකරණ මිල දී ගැනීම

පහසුව, මුදල් සහ බලශක්ති සංරක්ෂණය පිළිබඳව අවධානය යොමු කළ යුතු වේ. ඇතැම් ලක්ෂණ සමාන බව පෙනුණත් උපකරණවල බලශක්ති භාවිතයේ සැලකිය යුතු වෙනසක් ඇත.

බලශක්ති උපකරණ කිහිපයක නිවැරැදි තේරීම

නිතර භාවිතවන ගෘහස්ථ උපකරණ මිල දී ගැනීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු කිහිපයකි. එසේ ම ඒවා නිවැරැදි සැලසුමකින් යුතු ව භාවිතයෙන් ද බලශක්ති සංරක්ෂණයට දායක විය හැකි ය.

විදුලි උදුන් (Convection ovens)

සෑම විට ම ඇම්පියර් 13 (13 A) සම්මත පේනුව (plug) උපකරණය සමඟ ලබා දිය යුතු ය. එසේ නො ලැබුණ හොත් එය ලංකික වෙළෙඳපොළට ගැළපෙන ලෙස නිර්මාණය කරන ලද උපකරණයක් නො වේ. උදුනේ ධාරිතාව සම්පූර්ණ වන ලෙස ආහාර ද්‍රව්‍ය ඇතුළත් කිරීමෙන් ඉහළ කාර්යක්ෂමතාවක් අත් කරගන්න. නිතර ම දොර විවෘත නො කරන්න. මන්ද දොර විවෘත කරන සෑම අවස්ථාවක ම ෆැරන්හයිට් අංශක 25කින් උෂ්ණත්වය පහළ යයි. නියම වේලාවට වඩා විනාඩි 10කට පෙර උදුන නිවා දමන්න. උදුන සම්පූර්ණයෙන් ම සිසිල් වන තෙක් ඇතුළත ඇති දේ පිළිස්සීමට සහ තැම්බීමට ලක් වේ. නැත හොත් විකල්පයක් ලෙස අමතර උණුසුමෙන් අනෙක් ආහාර වර්ග ද උණුසුම් කරගත හැකි ය. මයික්රොවේව් උදුන් භාවිතයෙන් වේගවත් ව ආහාර පිසිය හැකි නිසා එය බලශක්ති සංරක්ෂණයට දායක වේ. එහෙත් එයට අවශ්‍ය ප්‍රාග්ධනය ඉහළ ය. ගෑස් භාවිතයෙන් ක්‍රියාත්මක වූ උදුන් වෙනුවට මේ මයික්රොවේව් උදුන් පහසුවෙන් ප්‍රතිස්ථාපනය කළ හැකි ය. ඇතැම් නිෂ්පාදකයෝ උදුන කලින් උණුසුම් කිරීම (preheat) යෝග්‍ය බව පවසති.

ම ඇතැම් උපකරණවල උෂ්ණත්ව පාලක වැනි විශේෂ බලශක්තිය ඉතිරි කර දෙන අංග ඇත. මෙවැනි නවීකරණය වූ කාර්යක්ෂම අංග සහිත විදුලි උපකරණ භාවිතෙන් කාර්යයන් පහසු වන්නා සේ ම විදුලිය ඉතිරි කර වියදම් අඩු කරයි.

මිල දී ගැනීම් සන්සන්දනය

වෙළෙඳපොළේ පිරියත සහ උපකරණ බහුල බැවින් පිරිවැය වාසි ලබාගැනීමට නම් අප උපකරණ විචක්ෂණශීලීව සන්සන්දනය කර බැලිය යුතු ම ය. මිල දී ගැනීමක දී කාලය,

මේ උණුසුම් කිරීමේ කාලය අවම මට්ටමකින් තබාගන්න, නොමැති නම් එයින් වළකින්න.

මිශක සහ යුෂ යන්ත්‍ර
(Mixers and Juicers)

ඒ ඒ කාර්යය සඳහා නිවැරැදි බ්ලෙන්ඩරය භාවිත කරන්න. ඒ සඳහා User Manual හෙවත් පරශීලනය සඳහා වූ අත්පොත පරීක්ෂා කරන්න. යළි යළිත් කුඩා කාර්යයන්ට මිශ්‍රකය (mixer) යොදාගැනීම වෙනුවට එක වර එහි ප්‍රශස්ත භාවිතය ලබාගන්න. සතිපතා අවශ්‍ය වන කුළු බඩු, සීනි, මිරිස්, තුනපහ කුඩු සතියට වරක්

ඇඹරීමට හෝ ඔබගේ අවශ්‍යතාවට ගැළපෙන ලෙස බලශක්තිය අඩුවෙන් වැය වන ලෙස එය සුදානම් කරගන්න. භාජනය උතුරා යන තෙක් ද්‍රව්‍ය ඇතුළු නො කරන්න. මන්ද ක්‍රියා කිරීමේ දී ද්‍රව මිශ්‍රකය පිටතට ගලා ඒමට පුළුවන. එසේ ගලා එන ද්‍රව, මෝටරය තුළට කාන්දු වී හානි විය හැකි ය. කිසි විටෙක ධාරිතාව ඉක්මවා හෝ පිරෙන තුරු හෝ මිශ්‍රකය නො පිරවිය යුතු ය. එසේ කිරීමෙන් මිශ්‍රකයේ මෝටරයට අනවශ්‍ය බරක් දැරීමට සිදු වේ. එය උපකරණයේ අකාර්යක්ෂමතාවට හේතු වේ. ශීතකරණය හෝ වෙනත් විද්‍යුත් උපකරණයක් හෝ සඳහා යොදාගන්නා කෙවෙනියක් (multi-plug or extension cord) මිශ්‍රකය සඳහා යෙදීමෙන් වළකින්න. නැත හොත් ක්ෂණික ව සිදු වන අධි විදුලි සැපයුමක් නිසා උපකරණයට හානි වීමේ සම්භාවිතාවක් පවතියි.

ගීසර සහ බොයිලේරු
(Geysers and Boilers)

සූර්ය ජල තාපකයන් සෑම විට ම නුවණැති තෝරාගැනීමක් වන්නේ අවශ්‍ය ඉන්ධනය නොමිලයේ ලැබෙන නිසා ය.

මේ පද්ධතිය සවි කළ පසු මෙහෙයුම් පිරිවැයක් නොමැත. විදුලි බලයෙන් සහාය වන

ඔබ කාර්යක්ෂමතාවෙන් ඉහළ උපකරණ මිල දී ගැනීම බුද්ධිමත් තයකි. මන්ද මිල දී ගැනීමේ දී වැඩි මිලක් දැරීමට වුවත් දීර්ඝකාලීන ව එමඟින් ඔබගේ මුදල් ඉතිරි වේ. බලශක්තිය පිරිමසින විශේෂාංග සහ නිර්මාණ මිල දී ගැනීමට උනන්දු වන්න.

සූර්ය උණුසුම් ජාල තාපකයන ශ්‍රී ලංකාවේ ඇති ගෙවන මුදලට උපරිම වටිනාකම ලබා දෙන කදිම විසඳුමකි. මාස කිහිපයක් තුළ එක් වරකට වැය වන පිරිවැය ආපසු ලබාගත හැකි ය. හීටර් සහ ගීසර් තුළ ජලය රත් කිරීමට සැලකිය යුතු බලශක්තියක් වැය වේ. විද්‍යුත් ගීසරයක් වොට් 2,000--3,000 අතර වේ. වොට් 3,000ක ගීසරයක් මඟින් ජල ලීටර් 50ක් සෙල්සියස් අංශක 35 දක්වා රත් කිරීමට විනාඩි 50ක කාලයක් වැය වේ. එම කාර්යය සඳහා ම වොට් 2,000ක ගීසරයක් සඳහා විනාඩි 75ක් වැය වේ. එබැවින් විදුලි අරපිරිමැස්ම සඳහා උපරිම කාර්යක්ෂමතාවෙන් යුතු උපකරණ භාවිත කළ යුතු ය. තව ද, මේ සමඟ ම ජල කරාමයකින් නෑමට වඩා ෂවරයක් උපයෝගී කරගෙන නෑම පිරිමැසුම්දායක ය.

ගීසරයේ උෂ්ණත්ව පාලකය පරීක්ෂා කරන්න. නිෂ්පාදකයන් විසින් පරිභෝගිකයන් හට ජලය ක්ෂණිකව උණුසුම් වන බව ඒත්තු ගැන්වීම සඳහා එය වැඩි ම උෂ්ණත්වයට දමා තබනු ලැබේ. නෑමට උණු වතුර භාවිතයේ දී සාමාන්‍යයෙන් පිළිගත් උෂ්ණත්ව මට්ටම් වනුයේ පුරුෂයන් හට සෙල්සියස් අංශක 40ත්, ස්ත්‍රීන් හට සෙල්සියස් අංශක 50ත් ය. තාපකය ඔබට අවශ්‍ය උෂ්ණත්වයට තැබීමේ හැකියාවක් ඇත්නම් ඔබගේ විදුලි කාර්මිකයා මාර්ගයෙන් එය සිදු කරගත හැකි ය. පිටතින් නිසි පරිවාරකයක් ඇති ගීසරයක් මිල දී ගන්න. ගීසරයේ සිට ජල කරාමය වෙත දිවෙන පයිප්ප නිසි පරිදි ද්‍රව්‍ය යොදා පරිවරණය කරන්න, නැත හොත් බිත්ති තුළ ඇතුළතින් ඒවා සවි කරන්න. ඔබ සතු ව ඇති ජල තාපකය මනාව පරිවරණය වී නොමැති නම් තවත් එය වටා පරිවාරණ යොදවන්න. ජල තාපකය දුරින් ස්ථානගත කරන්න. ගීසරය තුළ පිරිසිදු වීම ස්වයංක්‍රීය ව සිදු නො වේ. ජලයේ තත්ත්වය අනුව කලින් කලට අපද්‍රව්‍ය ඉවත් කිරීමෙන් කාර්යක්ෂම භාවිතයක් අත් කරගත හැකි ය. ගීසරයේ ප්‍රතිරෝධක ඇති වන නිසා තාපකය සෑම අවුරුදු 5කට හෝ 6කට වතාවක් මාරු කළ යුතු ය.

දැව ඉන්ධන හෝ ගෑස් උදුන් මඟින් ජලය රත් කිරීම ඉලෙක්ට්‍රොනික ගීසරවලට වඩා ආර්ථික වශයෙන් වාසිදායක ය.

බලශක්ති කළමනාකරුවන්ගේ සංගමයේ
සුදීප ලක්ෂාන්

අවශ්‍යතාව

උපකරණයක් මිල දී ගැනීමට පෙර එහි අවශ්‍යතාවක් ඇත් දැයි ඔබ ඔබෙන් ම විමසා දැනගන්න. "මා එය මිල දී ගත යුතු ද?" මා එය මිල දී ගන්නේ හුදු වෙළෙඳ දැන්වීමක් නිසා ද? අසල්වැසියන් සමඟ කරට කර සිටීමට ද? නැත්නම් ඇත්ත වශයෙන් ම මට එය අවශ්‍යම ද? යන්න සිතා බැලිය යුතු ය.

දෙවනුව අවශ්‍ය ප්‍රමාණය පිළිබඳව සලකා බලන්න. ඔබට අවශ්‍ය ප්‍රමාණයට වඩා විශාල හෝ වැඩි හෝ බලයක් සහිත උපකරණ ගැනීමෙන් වළකින්න.

බලශක්ති කාර්යක්ෂමතාව

ඔබ නිවසේ විදුලි බිල අඩු කරගැනීම සඳහා විදුලි උපකරණ කාර්යක්ෂම ලෙස භාවිත කිරීම මෙන්ම බලශක්ති කාර්යක්ෂම උපකරණ භාවිත කිරීම ද ඉතා වැදගත් වේ. එබැවින් විදුලි උපකරණයක් මිල දී ගැනීමේ දී වඩා බලශක්ති කාර්යක්ෂම උපකරණයක් තෝරාගැනීමට යොමු විය යුතු ය. බලශක්ති කාර්යක්ෂම උපකරණයක් භාවිතයේ දී වඩා අඩු විදුලි ප්‍රමාණයකින් වැඩි ප්‍රතිඵලයක් ලැබීමට ඇති හැකියාව නිසා විදුලි බිල අඩු කරගැනීමට මඟ පෑදෙයි. කාර්යක්ෂම උපකරණයක ජීවිත කාලය තුළ දී එයට වැය වන විදුලි ශක්තිය කාර්යක්ෂමතාව අඩු උපකරණයක් ගන්නා එම කාලය තුළ විදුලි ශක්තියට වඩා ඉතා අඩු අගයකි. එබැවින් විදුලි උපකරණයක් මිල දී ගැනීමේ දී එහි මූලික පිරිවැය ගැන පමණක් නො සලකා, උපකරණයේ මුළු ජීවිත කාලය තුළ එය ක්‍රියාත්මක කිරීමේ දී සහ නඩත්තුවේ දී යන අමතර වියදම් පිළිබඳව ද සිතා බැලිය යුතු ය. මෙහි දී බලශක්ති කාර්යක්ෂම විදුලි උපකරණ පහසුවෙන් හඳුනාගැනීමට අවශ්‍ය 'බලශක්ති තරු' සලකුණු සහිත ගුණාත්මක ලේබල්කරණයක් බොහෝ උපකරණ සඳහා හඳුන්වා දී ඇත. බලශක්ති කාර්යක්ෂමතා සහ පරිසර හිතකාමී ලේබල්කරණය පිළිබඳව සැලකිලිමත් වන්න. ලාම්පු, සිවිලින් විදුලි පංකා, ශීතකරණ, වායු සමන යන්ත්‍ර, පරිගණක යන මේ සියල්ල සඳහා බලශක්ති ලේබල් ඇත.

ඔබ කාර්යක්ෂමතාවෙන් ඉහළ උපකරණ මිල දී ගැනීම බුද්ධිමත් තීරණයකි. මන්ද මිල දී ගැනීමේ දී වැඩි මිලක් දැරීමට වුවත් දීර්ඝකාලීන ව එමඟින් ඔබගේ මුදල් ඉතිරි වේ. බලශක්තිය පිරිමසින විශේෂාංග සහ නිර්මාණ මිල දී ගැනීමට උනන්දු වන්න. ඔබ මිල සහ ක්‍රියාකාරිත්වය පිළිබඳව උනන්දු වනවා සේ ම උපකරණයේ බලශක්ති විශේෂාංග අයිතමයන් කෙරෙහි ද උනන්දු වන්න. බලශක්ති භාවිතය වැඩි කරන විශේෂාංග මොනවා ද යන්න ගැනත්, ඒවා ඔබට අවශ්‍ය ද යන්න ගැනත් අවබෝධයක් ලබාගන්න. උදාහරණක් ලෙස රෙදි වියළීමේ යන්ත්‍රයකට වොට් 3,000ක් වැය වන විට රෙදි සෝදන යන්ත්‍රයකට ඉන් පහෙන් එකක බලශක්ති ඒකක ප්‍රමාණයක් පමණක් වැය වීම දැක්විය හැකි ය. වසර පුරා සූර්ය තාපය හොඳින් ලැබෙන අප රටට රෙදි වියළනයක් අනවශ්‍ය ය. එනිසා රෙදි වියළන යන්ත්‍රයක් යනු බොහෝ විට බලශක්ති නාස්තියකි. එසේ

උපකරණ මිලට ගැනීමේ දී බලශක්ති කාර්යක්ෂමතාව යන සාධකය පිළිබඳව නිතර අවධානය යොමු කරන්න. ඇතැම් විට පරණ ශීතකරණය සහ කෙඳිරිගාමින් සිසිලස දෙන සිවිලිම් පංකාව ඉවත් කිරීම ඔබට අපහසු වීමට පුළුවන. එහෙත් මෙවැනි උපකරණ අකමැත්තෙන් වුව ද මාරු කළ යුතු ය. දීර්ඝකාලීන ව සැලකීමේ දී බලශක්ති කාර්යක්ෂම උපකරණ භාවිතයෙන් ඔබ පරණ උපකරණ ප්‍රතිස්ථාපනයට දැරූ පිරිවැය නැවත ලබා දී ඔබගේ ඉතුරුම් වැඩි කරයි. වැඩි වශයෙන් බලශක්තිය ඉතිරි කරගැනීමට බලශක්ති උපකරණ මිල දී ගැනීමේ දී ඔබත් පහත පරිදි පරීක්ෂාකාරී වනවා දැයි බලන්න.